

# පුරාතන

## ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය

ජාතික පුරාවිද්‍යා දින සමරු කලාපය 2005

මධ්‍යම සංස්කෘතික අරමුදල
සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය

# පුරාතන

## *ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය*


සංස්කරණය

ආචාර්ය ඩබ්.එච්.විජයපාල

අනුර මනතුංග

සංස්කාරක මණ්ඩලය

ශදානා මල්දෙණිය
ප්‍රිශාන්ත ගුණවර්ධන
ගාමිණී අදිකාරි
ආචාර්ය ජ්.එච්.එම්.එච්.අබයරත්න
සුමිත් රණසිංහ



මධ්‍යම සංස්කෘතික අරමුදල
සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය

2005

පුරාතන

*ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය*

ප්‍රථම මුද්‍රණය 2005

පිටපත් 1000

ලිපිවල අන්තර්ගතය පිළිබඳ වගකීම ඒ ඒ කතුවරුන් සතු වේ.

මධ්‍යම සංස්කෘතික අරමුදල
212, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

ISBN : 955-613-188-4
© මධ්‍යම සංස්කෘතික අරමුදල
මධ්‍යම සංස්කෘතික අරමුදල ප්‍රකාශන අංකය : 399

පිට කවරය :

මිහින්තලේ කණ්ටක චේතියේ
වාහල්කඩ කුලුණක ක්‍රි.ව. 2 වන
සියවසට අයත් කැටයම කි.

කවරය සැලසුම : මංගල කටුගම්පොළ
සම්බන්ධීකරණය සහ සහාය සංස්කරණය : චිත්‍රා දඹදෙණිආරච්චි
ලතා උඩවත්ත

පරිගණක පිටු සැකැස්ම : මනෝජනී පීරිස්
මජින්දා දයානි
රසිකා මහේෂ්වරී

මුද්‍රණය : පෙලිකන් ප්‍රින්ටර්ස් පුද්ගලික සමාගම, නැදිමාල, දෙහිවල

# සංස්කාරක සටහන

ජාතික පුරාවිද්‍යා දිනයට සමගාමීව මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් ප්‍රකාශයට පත් කරනු ලබන පුරාතන *ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය* සාමූහික ව්‍යායාමයක ප්‍රතිඵලයකි. මධ්‍යම සංස්කෘතික අරමුදල, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, ජාතික විශ්වවිද්‍යාල පද්ධතිය හා සම්බන්ධ පුරාවිද්‍යාඥයෝ රැසක් ම මේ කාර්යයෙහි ලා උත්සුක වූහ. සති දෙකක පමණ කෙටි කාලයක් තුළ ඔවුහු මේ සඳහා ලිපි සම්පාදනය කළ හ.

ජූලි මස 07 වන දා ට යෙදී තිබෙන ජාතික පුරාවිද්‍යා දිනය, එදින සිට සතියක් පුරා දීපව්‍යාප්තව ක්‍රියාත්මක කිරීමටත්, එහි අංගයක් ලෙස මෙම ලිපි සංග්‍රහය ප්‍රකාශයට පත් කිරීමටත් කටයුතු කරනු ලැබුවේ සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ හිටපු අමාත්‍ය ගරු විජිත හේරත් මැතිතුමා සහ නියෝජ්‍ය අමාත්‍ය ගරු සමන්ත විද්‍යාරත්න මැතිතුමාත්, දැක්වූ උනන්දුව සහ අනුග්‍රහය නිසාම ය. එම දෙපළටත්, එම අමාත්‍යාංශයේ සම්බන්ධීකරණ ලේකම් ලෙස කටයුතු කළ චමින්ද ජයනාථ සහ විජේදාස හේවාවිතාරණ යන මහතුන්ටත් මේ කාර්යයෙහි ලා අපගේ ස්තූතිය හිමි විය යුතු ය.

සංස්කෘතික කටයුතු සහ ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් ඒ.පී.ජී. ගුණසේකර මහතාගෙන් සහ පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සෙනරත් දිසානායක මහතාගෙන් මේ කාර්යයෙහි ලා ලැබුණු සහයෝගය ද අතිවිශාල ය.

මධ්‍යම සංස්කෘතික අරමුදලේ විද්‍යාත්මක ප්‍රකාශන උපදේශක මහාචාර්ය පී.එල්.ප්‍රේමතිලක මැතිතුමා සහ ප්‍රකාශන අංශයේ කාර්ය මණ්ඩලයේ සියලු ම දෙනා මේ සඳහා කැප වී ක්‍රියා කළ හ. මෙහි අලංකාර පිටකවරය කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා අංශයේ කථිකාචාර්ය මංගල කටුගම්පොළ මහතා විසින් සකස් කරනු ලැබී ය. ඉතා ඉක්මනින් මෙහි මුද්‍රණ කටයුතු නිසි ලෙන ඉටු කර දුන් පෙලිකන් ප්‍රින්ටර්ස් පුද්ගලික ආයතනයේ කාර්ය මණ්ඩලයට ද අපගේ ස්තූතිය හිමි විය යුතු ය.

සති දෙකක් පමණ කෙටි කාලයක් මෙතරම් විශාල ශාස්ත්‍රීය ලිපි ප්‍රමාණයක් එක් රැස් කොට, පුරාවිද්‍යා ක්ෂේත්‍රයට දායා ද කිරීමට හැකිවීම පිළිබඳව අප සැම සතුටු වන අතර ඒ සඳහා විවිධාකාරයෙන් සහාය දැක් වූ සැමට අපගේ කෘතඥපූර්වක ස්තූතිය හිමි වේ.

සංස්කාරක මණ්ඩලය

# පටුන


පිටුව

අතිගරු ජනාධිපති තුමියගේ සුබපැතුම් පණිවිඩය

ගරු අගමැති තුමාගේ සුබපැතුම් පණිවිඩය

සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යංශයේ ලේකම් තුමාගේ පණිවිඩය

පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ පණිවිඩය

මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ පණිවිඩය

සංස්කාරක සටහන

## පුරාවිද්‍යාව

1. පුරාවිද්‍යාව: එහි පරමාර්ථය, අරමුණු සහ මූලික කාර්යයන් - අනුර මනතුංග 1-5

2. ශ්‍රී ලංකාවේ ප්ලයිස්ටෝසීන අවධිය හා පුරාණ දේශගුණය - කැලුම් මනමේන්ද්‍රආරච්චි හා අනුෂි තිසාරා කාරියවසම් 6-19

3. ප්‍රාග් ඓතිහාසික උරුමය කළමනාකරණය - ගාමිණි අදිකාරි 20-23

## ඓතිහාසික පුරාවිද්‍යාව

4. මහින්දාගමනය සනාථ කරන පින්-බිම රාස්ස හෙළ හෙවත් රජගල - ආචාර්ය ඒ.එච්.එම්.එච්.අබයරත්න 24-28

5. ථූපාරාමය - අනුෂි තිසාරා කාරියවසම් 29-43

6. මහමෙව්නාවේ සිංහ වික්‍රාන්තිය - මහාචාර්ය ටී.ජී.කුලතුංග 44-51

7. අනුරාධපුර යුගයේ ස්තූපය අවකාශය තුළ අර්ථ විවරණය වීම - රාජ් බණ්ඩාර 52-67

8. අනුරාධපුර අභයගිරි විහාරයේ කැණීම්වලදී හමු වූ පැරණි වර්ණාලේපිත උළුවල සම්භවය සහ සංයුතිය පිළිබඳ නැවත සලකා බැලීමක් - ආචාර්ය මොහාන් අබයරත්න 68-73

9. කල්‍යාණි කණ්ණිකා හෙවත් පුරාණ නැගෙනහිර කැලණියේ පුරාවිද්‍යා අවශේෂ - සීවලි බණ්ඩාර මනතුංග 74-86

10. වලවෙ නදී තෙර අතීත ජනවාසයන්ගේ සමාජයීය සබඳතා - ගාමිණි දොඩම්වල 87-94

11. ශ්‍රී ලංකාවේ අතීත වාරි උරුමය හා වාරි පුරාවිද්‍යාව - චන්දන රෝහණ විතානාච්චි 95-100

12. පොළොන්නරු යුගයේ අවසානයේ සිට මහනුවර යුගය දක්වා සඳකඩපහණේ වර්ධනය - ඒ.ඒ.දයානන්ද අමරසේකර 101-108

13 මහනුවර යුගයේ චිත්‍ර කෙරෙහි බලපෑ මූලාශ්‍ර පිළිබඳ අධ්‍යයනයක් - උදා හෙට්ටිගේ 109-12

14. පුරාවිද්‍යාත්මක උපයෝගිතාව හා භාවිතය : මැටි බඳුන් - රංජිත් බණ්ඩාර දිසානායක 127-13


## අභිලේඛන සහ නාණකවිද්‍යාව


15. සමනබැද්ද විහාරයේ වහරල ලිපිය - පූජ්‍ය හබරකඩ වජිර හිමි 133-138

16. ආරම්භයේ සිට ක්‍රි.ව. 11 වන සියවස දක්වා ශ්‍රී ලංකාවේ ඓතිහාසික මූලාශ්‍රවලින් හඳුනාගත් මුදල් හා සම්බන්ධ තොරතුරු - ඉනෝකා බාලසූරිය 139-149

17. පුරාණ ලක්දිව වාණිජ කටයුතුවල ඉතිහාසය - තුසිත මැනිඳිස් 150-160


## සංස්කෘතික උරුමයන්


18. පුරාවිද්‍යා උරුමය සංවර්ධන ව්‍යාපෘති හා බලපෑම් ඇගයීම් ක්‍රියාත්මක කිරීම - ප්‍රිශාන්ත ගුණවර්ධන 161-172

19. සංවර්ධනය වන රටවල පවතින ඓතිහාසික නගර උරුමය කළමනාකරණයේදී තුඩු දෙන ගැටළු හා අභියෝග - චිත්‍රා දඹදෙණිආරච්චි 173-181

20. සංස්කෘතික උරුමය අභිමුව ජය ගත යුතු අභියෝග - අරුණ රාජපක්ෂ 182-194

21. ශ්‍රී ලාංකිය දේවාල ග්‍රාම තුළ පිවමාන ලකුණ : සොරගුණේ ග්‍රාම ස්මාරකය - සුමිත් රණසිංහ 195-201

22. ශ්‍රී ලංකාවේ භාවිත පැරණි මුදල් ඒකක ක්‍රම - සෙනරත් වික්‍රමසිංහ 202-205

23. ශ්‍රී ලංකාවේ ගිණි-අවි භාවිතයේ ඓතිහාසික පසුබිම - ඉන්දික ගුණවර්ධන 206-220

24. ශ්‍රී ලංකාවේ අම්බලම් - වාසනා සිරිමල්වත්ත 221-229

25. ශ්‍රී ලංකාවේ මැලේ උරුමය - එස්රා මෙලාති සල්ඩින් 230-239

# 13. මහනුවර යුගයේ චිත්‍ර කෙරෙහි බලපෑ මූලාශ්‍ර පිළිබඳ අධ්‍යයනයක්

උදා හෙට්ටිගේ

ක්‍රි.ව. දහ අට වන සියවසේ දී මහනුවර රාජධානිය පිහිටුවීමෙන් පසු නැවතත් ශ්‍රී ලංකාවේ බිතුසිතුවම් කලාවේ පුනරුදයක් ඇති විය. ඊට හේතුව: එවකට පිරිහී තිබුණු බුදු දහම පුනර්ජීවනය කිරීමට රාජානුග්‍රහය ලැබීම. භික්ෂූන් වහන්සේලා මූලිකත්වය ගැනීම මෙන්ම ජනතා සහයෝගය ද නො අඩුව ලැබීම යන්නයි. කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලයේ දී, සියම් දේශයෙන් උපසම්පදාව ගෙන්වා, උපසම්පදා කර්මය යළිත් පුනර්ජීවනය කොට යථා තත්ත්වයට පත් කිරීමට භික්ෂු සංඝයා ඇතුළු ගිහි ජනතාව උනන්දු වූ බවට සාධක තිබේ. වැලිවිට සරණංකර මාහිමියන්ගේ මූලිකත්වයෙන් ඇති වූ බෞද්ධ පුනර්ජීවනය නිසා සිද්ධස්ථානවල විශේෂ දියුණුවක් ඇති විය. මේ නිසා බිතුසිතුවම් කලාව ද නව මුහුණුවරකින් නැවත උද්දීපනය වන්නට විය. 18 වන සියවසේ දි උපසම්පදා නොලත් ඇතැම් භික්ෂූන් ද, සිතුවම් කලාවේ නියැලුන බවට සාධක ඇත. දෙගල්දොරුවේ හා රිදි විහාරයේ සිතුවම් කළ දෙවරගම්පොල සිල්වත් තැන එබඳු පුද්ගලයෙකි. කෙසේවෙතත් කලා ශිල්ප ආරක්ෂා වුයේ, වර්ධනය වුයේ, වෙහෙර විහාර හා දේවාල ඇසුරු කොට ගෙන බව පැහැදිලි කරුණකි. බුදු සමයේ පරිහානිය, කලාශිල්ප වල පරිහානියට හේතු වුයේ ද මේ කරුණු නිසාමය. විශේෂයෙන් ම දඹදෙණියුගයේ සිට මහනුවර යුගය දක්වා රටේ පැවති අස්ථාවර තත්ත්වයන් නිසා වෙහෙර විහාර සුලභ නොවීම, බිතුසිතුවම් විරල වීමට එක් හේතුවක් වූ බව පැවසිය හැකිය. එසේම චිත්‍ර ඇඳිමෙහි නිරත වූ ශිල්පී පරම්පරාවල වැඩීමට එකී පසුබිම සරු භූමියක් නොවීම ද විශේෂ හේතුවක් විය. මේ අවධියේ භික්ෂූන් වහනසේලා වෙහෙර විහාර

වල චිත්‍ර ඇන්දවීමට උනන්දු නොවූවද, පෞතිකඩ සිත්තම් කර්මාන්තය නොඅඩුව සිදු කළ බවට සාධක ඇත. (පුරාණ තුන් සරණය: 1948 : 92) (Beal. S.: 1869. 155) (සෙනෙවිරත්න අනුරාධ. 1983 : 176)

මහනුවර සමයට අයත් චිත්‍ර සංඛ්‍යාත්මක ඒකකයක් යැයි නිර්ණය කිරීම දුෂ්කරයි. එයට හේතුව විහාරාරාම විශාල ප්‍රමාණයක්, නුවර රාජධානිය තුළ ව්‍යාප්තව වී තිබීමයි. මහනුවර චිත්‍ර කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේත් (1747 - 1781) ඔහුගෙන් පසු රජ වූ රාජාධිරාජසිංහ රජුගේත් (1782-1798) කාලයේ දී අඳින ලද හෝ අළුත්වැඩියා කළ ඒවාය. පැරණි ලෙන් විහාර ගණනාවකම ඉපැරණි චිත්‍ර මකා දමා අළුතෙන් චිත්‍ර ඇඳ තිබේ. මහනුවර සම්ප්‍රදායට අයත් බිතුසිතුවම් වල දිනවකවානු සාමාන්‍ය වශයෙන් දැන ගත හැකිය. ක්‍රි.ව.1755 - 60 දක්වා වූ මහනුවර යුගයේ මුල් කාලයේ දී මැදවල විහාරස්ථානයේ චිත්‍ර කරන ලද බවත් එක්දහස්හත්සිය හැත්තෑ ගණන්වල හා 1780 ගණන් වල දෙගල්දොරුවේව චිත්‍ර අදින ලද බවත්, මෙම විහාරාරාමවල යොදා ඇති දිනවකවානු අනුව සිතා ගත හැකිය. මැදවල හා සූරියගොඩ චිත්‍රවල නිරූපනයව අඛණ්ඩව කථන සම්ප්‍රදායෙන් ආරම්භ වී දඹුල්ල, දෙගල්දොරුව, දළදා මාලිගාව වැනි ස්ථානවල විශාල පනේල ක්‍රමයේ සංරචණය දක්වා, චිත්‍ර විකාශනය වීමේ